නිපුණතාව 2 - ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොල සමතුලිතය සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.3 - ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වමින් මිල ඉල්ලුම් නම්‍යතාව විග්‍රහ කරයි.

ඉල්ලුම් නම්‍යතාව - ඉල්ලුම කෙරෙහි බලපාන ප්‍රමාණාත්මකව මැනිය හැකි ඕනෑම සාධකයක ප්‍රතිශතක වෙනසකට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රතිශතක වෙනස මැන දැක්වීම ඉල්ලුම් නම්‍යතාව නම් වේ.

ඉල්ලුම් නම්‍යතාවේ ප්‍රභේද 3කි.

1.මිල ඉල්ලුම් නම්‍යතාව
2.හරස් මිල ඉල්ලුම් නම්‍යතාව
3.ආදායම් ඉල්ලුම් නම්‍යතාව

මිල ඉල්ලුම් නම්‍යතාව - මිලෙහි ප්‍රතිශත වෙනසට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස්වීම මැන දැක්වීමයි.

මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කළ හැකි ආකාර දෙකකි.

1.ලක්ෂ්‍යය මිල ඉල්ලුම් නම්‍යතාව
2.චාප මිල ඉල්ලුම් නම්‍යතාව

<u>අභ්‍යාස</u>

1.ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාව හා චාප මිල ඉල්ලුම් නම්‍යතාව අතර වෙනස පැහැදිලි කරන්න.

2.මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම අනුව මිල ඉල්ලුම් නම්‍යතාවයේ හඳුනාගත හැකි ප්‍රභේද නම් කර උදාහරණ සමඟ පැහැදිලි කරන්න.